සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	කාලය / நேரம் / Time
10 ශ්‍රේණිය	පැය 01යි

ඉතිහාසය - I

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

උපදෙස්:

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින්, නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගයේ ආරම්භය දක්වා කාලයේ ලියැවුණු බොහෝ කෘතිවල ප්‍රධාන අරමුණ වූයේ,
   (1) දේශපාලන තොරතුරු ඉදිරිපත් කිරීමය. (2) රජවරුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමය.
   (3) ආර්ථික තොරතුරු ඉදිරිපත් කිරීමය. (4) ආගමික තොරතුරු ඉදිරිපත් කිරීමය.

2. පැරණි කාන්තාවන්ගේ විලාසිතා පිළිබඳව තොරතුරු අධ්‍යයනය කරන්නෙකුට වඩාත් වැදගත් මූලාශ්‍රය කුමක්ද ?
   (1) පැරණි කාසි (2) සීගිරි චිත්‍ර (3) සීගිරි කුරුටු ගී (4) දඹුලු විහාරයේ චිත්‍ර

3. ප්‍රාග් ඓතිහාසික මානවයා මුහුදුබඩ ප්‍රදේශ සමග සබඳතා පැවැත් වූ බවට තොරතුරු ලබාදෙන ස්ථානය කුමක්ද?
   (1) කිතුල්ගල බෙලිලෙන (2) අත්තනගොඩ අළු ලෙන
   (3) පොතාන ලෙන (4) පාහියන්ගල ලෙන

4. සකපෝරුව භාවිතා කරමින් සකස් කර ඇතැයි සැලකෙන පින්තාරු කරන ලද මැටි බඳුනක කොටස් හමුවී ඇති ප්‍රදේශ දෙක සඳහන් පිළිතුර කුමක්ද?
   (1) හල්දුම්මුල්ල හා බෙරගල (2) බෙරගල හා ඉබ්බන්කටුව
   (3) රංචාමඩම හා හල්දුම්මුල්ල (4) රංචාමඩම හා ඉබ්බන්කටුව

5. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වියළි කලාපය තුළ ව්‍යාප්ත වීමට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ,
   (1) පසේ සාරවත් භාවයයි. (2) ගංගා රාශියක් පැවතීමයි.
   (3) තැනිතලා බිම් පැවතීමයි. (4) වර්ෂාව අධිකව ලැබීමයි.

6. පහත දැක්වෙන 'අ' සහ 'ආ' තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුරු තෝරන්න.

'අ'	'ආ'
1. යටහලෙන සෙල්ලිපිය	A - නැගෙනහිර ප්‍රදේශයේ රජු
2. ඇඹුල් අඹේ සෙල්ලිපිය	B - තොටුපොළ බදු අයකිරීම.
3. කොත්ගල්කන්ද සෙල්ලිපිය	C - දසගම් ඇත්තන්
4. කළු දිය පොකුණ සෙල්ලිපිය	D - ප්‍රාදේශීය පාලකයෙකු

(1) D, C, B, A (2) A, B, C, D (3) D, A, B, C (4) A, D, B, C

Past Papers Wiki

7. පැරණි සෙල්ලිපි අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්ම අනුව රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී හඳුන්වන නම කුමක්ද?
(1) පන අදෙක (2) නට අදෙක (3) කොතුරු ගෑ නා (4) කනපෙඩික

8. ශ්‍රී මහා බෝධිය රෝපණය කරන අවස්ථාවේ චන්දනගාම හා කාවරගාම ක්ෂත්‍රියන්ට ආරාධනා කළ රජතුමා කවුද?
(1) දේවානම්පියතිස්ස (2) දුටුගැමුණු (3) වසභ (4) පළමුවන විජයබාහු

9. • සංවිධානාත්මක සටන් ව්‍යාපාරයක් මෙහෙයවීම.
• ප්‍රතිමල්ලවයාගේ සොහොනට නිසි ගෞරව දැක්වීම.
ඉහත තොරතුරුවලින් කුමන රජතුමා පිළිබඳ විස්තර වේ ද?
(1) පළමුවන විජයබාහු (2) වසභ (3) දුටුගැමුණු (4) පණ්ඩුකාභය

10. අනුරාධපුරය අගනගරය ලෙස පැවති සමයේ ප්‍රාදේශීය පාලනය විධිමත්ව පැවති බව පැහැදිලිව පෙන්වා දෙන මූලාශ්‍රය කුමක්ද?
(1) තෝනිගල සෙල්ලිපිය (2) වල්ලිපුරම් රන්පත
(3) පනාකඩුව තඹ සන්නස (4) ගල්පොත සෙල්ලිපිය

11. අනුරාධපුරය අතහැර පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය ලෙස පිහිටුවා ගැනීමෙන් පළමුවන විජයබාහු රජු බලාපොරොත්තු වූ ප්‍රධාන අරමුණ වූයේ කුමක්ද?
(1) රුහුණේ වෙළඳ කටයුතු පාලනය කිරීම.
(2) අනුරාධපුරය ආරක්ෂා කර ගැනීම.
(3) ත්‍රිකුණාමල වරායේ වෙළෙඳ කටයුතු පාලනය කිරීම.
(4) මාතොට වරායේ වෙළඳ කටයුතු පාලනය කිරීම.

12. අනුරාධපුර නගරයක් ලෙස වර්ධනය වීමට තුඩු දුන් එක් නිශ්චිත ප්‍රධාන සාධකයක් වන්නේ,
(1) නගර සීමා ලකුණු කිරීම ය. (2) ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීම ය.
(3) අන්තර්ජාතික වෙළඳාම ය. (4) අධ්‍යාපනය දියුණු වීම ය.

13. ක්‍රිස්තු වර්ෂ 9 වන සියවසට අයත් සෙල්ලිපිවල 'සභාව' යන පදයෙන් අදහස් කර තිබෙන්නේ,
(1) ගම් සභාව යි. (2) ව්‍යවස්ථාදායකය යි. (3) විධායකය යි. (4) අධිකරණය යි.

14. ඕනෑම කාලයක ඕනෑම සමාජයක ජීවත් වන වැඩි පිරිස වන්නේ,
(1) ප්‍රභූවරුය. (2) රජයේ නිලධාරීන් ය.
(3) සාමාන්‍ය ජනතාව ය. (4) ආගමික නායකයන් ය.

15. අතීතයේ 'වොහාර' යන නමින් හැඳින් වූ පුද්ගලයන්ගෙන් ඉටු වූ කාර්යය වන්නේ,
(1) අධිකරණයේ විනිශ්ච කටයුතු සිදු කිරීම යි.
(2) යුක්තිය පසිඳලීමට රජුට අවශ්‍ය උපදෙස් දීම යි.
(3) වැරදිකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම යි.
(4) මධ්‍යම රජය වෙනුවෙන් අධිකරණය නියෝජනය කිරීම යි.

16. ත්‍රිපිටක ධර්මය ට වැඩි විස්තර සහිත අටුවා රචනා කළ මහා විහාරයේ අධ්‍යයන කටයුතුවල නිරත වූ විදේශික භික්ෂූන් වහන්සේ,
(1) පාභියන් හිමි ය. (2) හියුංසියැං හිමි ය. (3) බුද්ධඝෝෂ හිමි ය. (4) සංඝමිත්‍ර හිමි ය.

17. "අපරිමිත ලොකහි - බුධ සමෙ නති" ලෙසට සඳහන් වන නිසඳැස් කවිය හමුවන්නේ,
(1) වෙස්සගිරියෙනි. (2) කිරින්ද පන්සලෙනි. (3) මිහින්තලයෙනි. (4) සිතුල්පව්වෙනි.

Past Papers Wiki

18. වැව් බැම්ම තැනීමේ තාක්ෂණයේ ස්වරූපය අවබෝධ කර ගැනීමට පුරාවිද්‍යාඥයන් විසින් කැණීම් කොට පරීක්ෂා කරන ලද වැව කුමක්ද?
(1) සීගිරි මහ වැව (2) තිසා වැව (3) හුරුළු වැව (4) පදවිය වැව

19. මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන්ගඟ හරස් කර මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා කන්තලේ වැව්වලට ජලය ගෙනයාමට ඉදිකළ ඇළ කුමක්ද?
(1) තල්වතු ඇළ (2) යෝධ ඇළ (3) ඇළහැර ඇළ (4) මිනිපේ ඇළ

20. ලිමොනයිට් සහ හෙමටයිඩ් යන රසායනික නම්වලින් හඳුන්වන පාෂාණ වර්ග යොදාගෙන යකඩ උණු කළ බවට සාක්ෂි හමුවී ඇත්තේ,
(1) දෙහි ගහ ඇළ කන්ද ප්‍රදේශයෙනි. (2) බෙරගල ප්‍රදේශයෙනි.
(3) අළ කොළ වැව ප්‍රදේශයෙනි. (4) සමනල වැව ප්‍රදේශයෙනි.

21. අතීත ආභරණ සැකසීමේ තාක්ෂණයේ විශ්මිත බව පෙන්වන මල් කැටයම් 21ක් සහිත වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක් හමු වී ඇති ස්ථානය කුමක්ද?
(1) අභයගිරිය (2) මහා විහාරය (3) ජේතවනය (4) ඉසුරුමුණිය

22. රත්නපුර දිස්ත්‍රික්කයට අයත් ගල්පාය නම් ප්‍රදේශයේ කැණීම්වලින් සොයාගත් පැරණි දේවාලයේ සිදු කළ ශාන්ති කර්මය කුමක්ද?
(1) කිරිමඩු ශාන්ති කර්මය (2) දෙවොල්මඩු ශාන්ති කර්මය
(3) පත්තිනි ඇදහීම (4) කොහොඹා කංකාරිය

23. ප්‍රධාන මාවත්වල ගව්වෙන් ගව්වට ගල් කණු සිටුවීමට නියෝග කළ රජතුමා කවුද?
(1) වික්‍රමබාහු රජු (2) නිශ්ශංක මල්ල රජු
(3) පළවන විජයබාහු රජු (4) පළමුවන පරාක්‍රමබාහු රජු

24. ස්තිරීක ජල විද්‍යා මූලධර්මය පැරණි ලාංකික ඉංජිනේරුවන් සතුව පැවැති බව සනාථ කිරීමට උදාහරණයක් වන්නේ,
(1) යතුරු පොකුණ යි. (2) සඳකඩපහණ යි. (3) ලෝකඩ ඇත් පහන යි. (4) දියකැට පහන යි.

25. ප්‍රභූවරුන්ගේ මට්ටමට පහළින් සිටි රටේ සාමාන්‍ය ජනතාව සෙල්ලිපිවල හඳුන්වා ඇති නම කුමක්ද?
(1) කුඩින් (2) අන්වයාතදාස (3) රදළ (4) දණ්ඩනායක

26. රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හැඳින්වූ නම කුමක්ද?
(1) දකපති (2) කැති අඩ (3) බොජකපති (4) කෙටුකනබ

27. කාසි අච්චු ගැසීමේ කටයුත්ත භාරව සිටි නිලධාරියා ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ,
(1) අදෙක නමිනි. (2) බතගු නමිනි. (3) නට අදෙක නමිනි. (4) රූපදක නමිනි.

28. තමන්ගේ ස්වාමියා දුර රටක වෙළඳ කටයුතුවල නියැළී වසර තුනකින් නැවත පැමිණෙන තුරු හුදකලාව කාලය ගත කළ කාන්තාවක් පිළිබඳ විස්තර සඳහන් වන කෘතිය කුමක්ද?
(1) සද්ධර්මාලංකාරය (2) රසවාහිනිය
(3) සහස්සවත්ථුපකරණය (4) දම්පියා අටුවා ගැටපදය

29. ගස් කොළන් කළමනාකරණයේ දී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කරන ලෙස රජයේ නිලධාරීන්ට උපදෙස් දී ඇති සෙල්ලිපිය කුමක්ද?
(1) බුද්ධන්නෙහෙල ලිපිය (2) කොණ්ඩවට්ටවාන් ලිපිය
(3) අනුරාධපුර පුවරු ලිපිය (4) තෝනිගල ලිපිය

30. ගම්පොළ රාජධානි සමයේ දී මාතෘ මූලික උරුම ක්‍රමයකට අනුව මාමාගෙන් පසු බෑනාට රජකම හිමි වීම යටතේ රාජ්‍යත්වයට පත් වූයේ කවුද?
(1) හත්වන පරාක්‍රමබාහු රජු (2) සිව්වන විජයබාහු රජු
(3) හයවන පරාක්‍රමබාහු රජු (4) තුන්වන වික්‍රමබාහු රජු

31. පහත සඳහන් සිදුවීම් අතුරින් යාපන රාජ්‍යයට සම්බන්ධ නිවැරදි සිදුවීම තෝරන්න.
(1) යාපනයේ බහුතර ජනතාව පෘතුගීසීන්ට පක්ෂපාතී වීම.
(2) කෝට්ටේ රාජධානිය බිඳවැටීමෙන් පසු යාපන රාජ්‍ය බිහිවීම.
(3) ආර්ය චක්‍රවර්ති රජ පරපුර විසින් යාපන රාජ්‍ය පාලනය කිරීම.
(4) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයා සංකිලි රජු වීම.

32. දෙවන නාගරීකරණය සමයේ පැවති ආර්ථික රටාව පිළිබඳව සාවද්‍ය පිළිතුර තෝරන්න.
(1) චීනයෙන් ශ්‍රී ලංකාවට පිඟන් භාණ්ඩ ආනයනය කර තිබේ.
(2) විශාල වශයෙන් කුරුඳු වගාව සිදුවිය.
(3) විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකාරිය යටතේ පැවතුනි.
(4) වෙළඳාම සම්බන්ධයෙන් අභ්‍යන්තර කඩවීදී පැවැති බව කුරුණෑගල විස්තරයේ සඳහන් වේ.

33. ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසීන් වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගන්න අවස්ථාවේ දී උඩරට පාලනය කළ රජතුමා
(1) රාජාධි රාජසිංහ (2) කීර්ති ශ්‍රී රාජසිංහ (3) ශ්‍රී වික්‍රම රාජසිංහ (4) ශ්‍රී විජය රාජසිංහ

34. උඩරට පාලන සමයේ අධිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස හැඳින්වූයේ කවර නමකින් ද?
(1) මුහන්දිරම් (2) කටුපුල්ලේ (3) ලියන රාළ (4) උණ්ඩිය රාළ

35. උඩරට රාජධානි සමය තුළ ගම්වැසියන් පරම්පරාගතව භුක්ති විඳි ඉඩම් හැඳින්වූ නම
(1) ගබඩාගම් ය. (2) නින්දගම් ය. (3) විහාරගම් ය. (4) පරවේණිගම ය.

36. ඉතාලියේ ප්‍රසිද්ධ මානවවාදී ගත් කතුවරයෙකු වූ අලගියරි ඩාන්ටේ විසින් රචනා කළ කාව්‍ය ග්‍රන්ථය කුමක්ද?
(1) ලෝරාට සැහැලි කවි (2) ඩිවිනා කොමිඩියා (3) ද ටෙම්පස්ට් (4) රෝමියෝ ජුලියට්

37. නූතන තාරකා විද්‍යාවේ පියා යන ගෞරව නාමයෙන් හඳුන්වන විද්‍යාඥයා කවුද?
(1) ගැලීලියෝ ගැලීලි (2) ජොහැන්ස් කෙප්ලර් (3) නිකලස් කොපර්නිකස් (4) අයිසැක් නිව්ටන්

38. පුනරුදයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කමක් සඳහන් පිළිතුර කුමක්ද?
(1) ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳවැටීම.
(2) බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට ප්‍රචලිත වීම.
(3) යුරෝපීය ගෘහ නිර්මාණ ශිල්පය මෙරටට ලැබීම.
(4) යුක්තිය පසිඳලීමේ අධිකරණ පද්ධතියක් මෙරට ස්ථාපිත වීම.

39. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන අවධියේ කෝට්ටේ රාජධානියේ පාලකයා වූයේ,
(1) අටවන වීර පරාක්‍රමබාහු රජතුමා ය. (2) හයවන විජයබාහු රජතුමා ය.
(3) හත්වන බුවනෙකබාහු රජතුමා ය. (4) ධර්ම පරාක්‍රමබාහු රජතුමා ය.

40. ලන්දේසීහු උඩරට රජවරුන් සමග කටයුතු කිරීමේදී බොහෝදුරට ගැටුම් ඇති කර ගැනීමෙන් වැළකී සිටීමට ප්‍රධානතම හේතුව මින් කුමක්ද?
(1) වියදම අඩුකර ගැනීම ලන්දේසි ප්‍රතිපත්තිවල මූලික ලක්ෂණයක් වීම.
(2) උඩරට රජවරුන්ගේ යුධ ශක්තිය හමුවේ ලන්දේසි බලය දුර්වල වීම.
(3) උඩරටට හමුදා යැවීමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීම.
(4) උඩරට රජවරුන් අමනාප කර ගැනීම තම වෙළඳ කටයුතුවලට බාධාවක් නොවීම.

PAST PAPERS WIKI
www.PastPapers.Wiki

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	ඉතිහාසය - II	කාලය / நேரம் / Time: පැය 03යි. / மணி. 10යි.

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

සැලකිය යුතුයි;

- I කොටසේ ප්‍රශ්න අංක 01 **අනිවාර්ය** වේ.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** ද, III කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

I කොටස

1) අ). පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) කුරුණෑගල, පදවිය වැව, කළු ගඟ, වාලුකාගාම, ෆෙඩ්රික් කොටුව, සෙංකඩගල, කනගරායන් ආරු, මඩකලපුව, පොම්පරිප්පු, බුන්දල, අලිමංකඩ, අලිගල (ලකුණු 12)

(ii) රෝමය, පර්සියන් බොක්ක, කළු මුහුද, කැලිකට්, චීනය, මලය අර්ධද්වීපය (ලකුණු 06)

ආ). පහත A, B C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - මැදිරිගිරියේ ඇත් වෙහෙර නම් පධානඝරයට ඉඩම් පූජා කරන ලද පාලකයා
B - නවවන සියවසේ සෙල්ලිපිවල නීති නියාමනය කරන ලද ආරක්ෂක නිලධාරීන් හඳුන්වන නම
C - පෘතුගීසීන් විසින් කොනප්පු බණ්ඩාර බෞතීස්ම කිරීමෙන් පසු හඳුන්වන ලද නම
D - වර්ෂ 1453 දී තුර්කිවරුන් විසින් අත්පත් කරගන්නා ලද නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අග නගරය

(ලකුණු 04)

ඉ). A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A රූපය

i. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. එය නිර්මාණය කර ඇති මාධ්‍යය නම් කරන්න.

iii. මේවා අයත් වන්නේ කුමන මූලාශ්‍රය ගණයට ද?

iv. මේවා යොදාගෙන ඇත්තේ කුමන කාර්යයක් සඳහා ද?

(ලකුණු 04)

Past Papers Wiki



B රූපය

i. B රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

ii. මෙය පිහිටා ඇත්තේ කුමන නගරයක ද?

iii. මෙහි දක්නට ලැබෙන වාස්තු විද්‍යාත්මක ශිල්පය නම් කරන්න.

iv. මෙය අයත් වන්නේ කුමන ආගමකට ද?

(ලකුණු 04)

II කොටස

2) i. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන ග්‍රීක මූලාශ්‍රය **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. ඉතිහාසය හැදෑරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)

iii. ඉතිහාසය හැදෑරීමේදී සෙල්ලිපි වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** මගින් විස්තර කරන්න. (ලකුණු 05)

iv. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අප රැකගත යුත්තේ ඇයිදැයි කරුණු **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

3) i. a). ගල් යුගයේ ප්‍රජාව ජීවත් වූ වියළි කලාපීය ගල් ගුහා වාසස්ථාන දෙකක් ද,

b). අර්ධ ශුෂ්ක කලාපීය වෙරළබඩ එළිමහන් වාසස්ථානයක් ද නම් කරන්න. (ලකුණු 03)

ii. පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සුසාන භූමි පිහිටි ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

iii. පූර්ව ඓතිහාසික යුගයේ ජනතාවගේ තාක්ෂණය කරුණු **දෙකක්** යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

4) i. පහත සඳහන් තොරතුරු ඇතුළත් වන මූලාශ්‍රය නම් කරන්න.

A - ගම්කයන් පත්වූයේ ගෘහපතියන් අතරින්ම බව සඳහන් වන මූලාශ්‍රය

B - ගම්ක සිව, ගම්ක සුමන, ගම්ක තිදන යන ගම්කයන් භික්ෂූන් වහන්සේලා ට ගල් ගුහාවක් පූජා කළ බව සඳහන් සෙල්ලිපිය

C - තොටබොජක නම් පරුමකයා පිළිබඳ සඳහන් වන සෙල්ලිපිය (ලකුණු 03)

ii. පහත සඳහන් රාජ්‍යත්ව සංකල්ප භාවිත කළ පාලකයන් නම් කරන්න.

A - නරේෂ්වර රාජ B - දේවත්ව රාජ

C - ආලකමන්දාධිපති රාජ D - චක්‍රවර්ති රාජ (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ ප්‍රථම පාලකයා වූ පණ්ඩුකාභය රජු බලය මධ්‍යගත කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. අතීත ශ්‍රී ලංකාවේ පාලකයාගෙන් ජනතාව බලාපොරොත්තු වූ ප්‍රධාන කාර්යයන් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

Past Papers Wiki

5) i. අතීතයේදී අවකාශය මැනීම සඳහා භාවිත කරන ලද ඒකක **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පහත සඳහන් වැව් ඉදිකරන ලද්දේ කුමන ගංගා ආශ්‍රිතව දැයි ලියන්න.

A - නාච්චදූව වැව

B - කලා වැව

C - හුරුළු වැව

D - ඉරණමඩු වැව (ලකුණු 04)

ii. අතීත පාලකයන් ජනතාවගේ සනීපාරක්ෂාව හා ස්වස්ථතාව කෙරෙහි ඉතා සැලකිලිමත් වූ බව කරුණු **දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. අතීත ශ්‍රී ලංකාවේ දියුණු වාස්තු විද්‍යාත්මක තාක්ෂණයක් පැවැති බව රුවන්වැලි සෑයේ අත්තිවාරම ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

6) i. a). පළමු නාගරීකරණයට අයත් උතුරු මැද වියළි කලාපයේ පිහිටි රාජධානි **දෙකක්** සහ

b). දෙවන නාගරීකරණයට අයත් පහතරට තෙත් කලාපයට අයත් රාජධානියක් නම් කරන්න. (ලකුණු 03)

ii. පොළොන්නරු රාජධානිය පරිහානියට බලපෑ හේතු **හතරක්** ලියන්න. (ලකුණු 04)

iii. දෙවන නාගරීකරණ සමයේ කලාව හා ගෘහ නිර්මාණකරණයේ දක්නට ලැබෙන වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. ගම්පොළ රාජධානි සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

7) i. දහසයවන ශතවර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපීය ජන කොටස් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පෘතුගීසීන් උඩරට රාජධානිය අත්පත් කර ගැනීම සඳහා කරන ලද සටන් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

iii. කීර්ති ශ්‍රී රාජසිංහ රජු බුද්ධ ශාසනයේ උන්නතිය සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. උඩරට රාජධානිය සම්බන්ධයෙන් ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

PAST PAPERS WIKI

III කොටස

8) i. මධ්‍යතන යුගයේ දී පල්ලිය විවේචනය කළ පුද්ගලයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

ii. පුනරුද සමයේ දී පහත සඳහන් සොයා ගැනීම් සිදුකරන ලද පුද්ගලයන් නම් කරන්න.

A - පෘථිවිය ගෝලාකාර බව

B - ග්‍රහලෝක සූර්යා වටේ ඉලිප්සාකාරව ගමන් කරන බව

C - දුරදක්නය

D - ලෙඩ රෝග සෑදීමට තුඩුදෙන හේතු සහ නව රෝග චිකිත්සක ක්‍රම (ලකුණු 04)

iii. යුරෝපා ජාතීන්ට නව මුහුදු මාර්ග සොයා ගැනීමට ඉවහල් වූ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. පුනරුදය නිසා ශ්‍රී ලංකාවේ සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

9) i. පුනරුද සමයේ කලා කටයුතු සහ වෙළඳාම අතින් විශාල දියුණුවක් ලැබූ ඉතාලි නගර **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පුනරුද සමයේ පහත සඳහන් රටවල්වලින් බිහි වූ මානවවාදී ග්‍රන්ථ කතුවරුන් දෙදෙනා බැගින් නම් කරන්න.

a. ඉතාලිය

b. එංගලන්තය (ලකුණු 04)

iii. පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05)

iv. පුනරුද සමයේ චිත්‍ර කලාවේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025


ශ්‍රේණිය / தரம் / Grade	ඉතිහාසය / History / வரலாறு	සිතියම්
10 ශ්‍රේණිය	II / II / II	

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

(අ) (i)

1. (ஆ) (i)

(a) (i)




Past Papers Wiki

(இ) (ii)

1. (அ) (ii)

(a) (ii)



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library